020

සියලුම හිමිකම් ඇවිරිණි
[illegible]
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 6 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ............................................................................ කාලය: පැය 02යි.

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් දී ඇති වාක්‍යය සම්පූර්ණ කිරීමට සුදුසු වචනය වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

(01) බුද්ධ වර්ෂ ආරම්භ වන්නේ බුදුන්වහන්සේගේ .................................................... සිදු වූ දින සිට ය.

(මහා පරිනිර්වාණය , බුද්ධත්වය)

(02) පළමුවරට ගින්දර භාවිත කිරීමට පුරුදු වූයේ ................................ මානවයාය.

(හෝමෝ හැබිලස් / හෝමෝ ඉරෙක්ටස්)

(03) ඊජිප්තු ශිෂ්ටාචාරය බිහි වූයේ .................................................... ගංගාවේ පහළ කොටසට අයත් නිම්න ප්‍රදේශයේ ය. (නයිල් / සින්ධු)

(04) විජය කුමරු ඇතුළු පිරිස ජනාවාස පිහිටුවා ගත්තේ .................................................... ආශ්‍රිත ප්‍රදේශයේ ය.

(කලා ඔය / මල්වතු ඔය)

(05) නගරයක් අසළ පළමුවරට වැවක් ඉදිකරන ලද්දේ .................................................... රජු විසිනි.

(දේවානම්පියතිස්ස / පණ්ඩුකාභය)

- අංක 06 සිට 10 තෙක් ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (x) ලකුණ ද වරහන තුළ යොදන්න.

(06) පුරාශිලා යුගයේ දී මළගිය නෑදෑයින් වෙනුවෙන් අවමංගල්‍ය චාරිත්‍ර පැවැත්වීමට මිනිසා හුරු පුරුදු විය. (   )

(07) පළමුවරට රබර් බෝලයක් සාදන ලද්දේ චීන ශිෂ්ටාචාරයට අයත් වැසියන් විසිනි. (   )

(08) විජය කුමරු මෙරටට ගොඩබසින විට එම ප්‍රදේශවල ජීවත් වූයේ යක්ෂ නමින් හැඳින් වූ ගෝත්‍රික පිරිසකි. (   )

(09) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහා බෝධිය රැගෙන වැඩම කරවූයේ ලංකා පට්ටන වරායටයි. (   )

(10) අභයගිරි විහාරය අප රටේ පැවති අන්තර් ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයකි. (   )

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) ගල් මෙවලම් තැනීමේ කුසලතාවය දියුණු කිරීම නිසා "හැකි මිනිසා" නමින් හැඳින්වූයේ,

(1) හෝමෝ හැබිලස් මානවයා (2) හෝමෝ ඉරෙක්ටස් මානවයා

(3) හෝමෝ නියැන්ඩතාලෙන්සිස් මානවයා (4) ඔස්ට්‍රෙලෝ පිතකස් මානවයා

(12) හමුරාබි නම් පාලකයා විසින් නිකුත් කරන ලද ලෝකයේ පැරණිතම නීතිපොත අයත් වන්නේ කුමන ශිෂ්ටාචාරයට ද?

(1) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයටයි. (2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයටයි.

(3) ඊජිප්තු ශිෂ්ටාචාරයටයි. (4) චීන ශිෂ්ටාචාරයටයි.

(13) ලෝකයේ පැරණිතම සාහිත්‍ය කෘතිය ලෙස සැලකෙන ගිල්ගමේෂ් නැමැත්තාගේ වීර කාව්‍ය ලියා ඇත්තේ,

(1) මැටි පුවරුවක ය. (2) පැපිරස් පත්‍ර වල ය.

(3) ගල් පතුරු මත ය. (4) සත්ව අස්ථි වල ය.

(14) මෙහෙණි සසුනට ඇතුළත් වූ පළමු ලාංකික කාන්තාව වන්නේ.

(1) සෝමා දේවියයි. (2) අනුලා දේවියයි.

(3) සුගලා දේවියයි. (4) විහාර මහා දේවියයි.

(15) පැරණි සෙල් ලිපිවල "පිත මහ රජ" ලෙස හඳුන්වා ඇති රජු කවුරුන් ද?

(1) දේවානම්පියතිස්ස රජු ය. (2) පණ්ඩුකාභය රජු ය.

(3) වළගම්බා රජු ය. (4) වසභ රජු ය.

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

(16) මහා වංශය රචනා කරන ලද්දේ ........................................ හිමියන් විසිනි.

(17) ලෝකයේ පළමු ජීව විශේෂය බිහි වන්නේ ........................................ බැක්ටීරියාව ඇසුරිනි.

(18) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයට අයත් වන වර්තමාන ප්‍රදේශය ........................................ නමින් හඳුන්වයි.

(19) විජය කුමරු විසින් ........................................ නගරයේ දී සියළු ම යක්‍ෂ ගෝත්‍රික නායකයින් විනාශ කරන ලදී.

(20) වළගම්බා රජු විසින් අභයගිරි විහාරය ........................................ හිමියන්ට පූජා කරන ලදී.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- මෙම කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.



(01) (අ) දී ඇති පින්තූරය ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මෙම පින්තූරයෙන් දක්වෙන්නේ කුමක් ද?

(2) එම ශිෂ්ටාචාරයට අයත් නගර දෙකක් නම් කරන්න.

(3) මෙම නිර්මාණය අයත් ශිෂ්ටාචාරය කුමක් ද?

(4) මෙම නිර්මාණය කිරීමට යොදාගත් ද්‍රව්‍යය කුමක් ද?

(ලකුණු 2×4 = 08)



(ආ) (1) මෙම රූපයෙන් දක්වෙන චෛත්‍ය කුමක් ද?

(2) එය ඉදි කරවන ලද්දේ කවුරුන් විසින් ද?

(3) මෙම චෛත්‍යයේ වර්තමාන හැඩය කුමක් ද?

(4) මෙම චෛත්‍යය වටා ඉදිකර තිබූ නිර්මාණය කුමක් ද?

(ලකුණු 2×4 = 08)

(02)(1) ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය බෙදා ඇති කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) පහත දක්වෙන වර්ෂ ආරම්භ කරන්නට මුල් වූ ආගමික නායකයින් දෙදෙනා නම් කරන්න.

a. ක්‍රිස්තු වර්ෂ b. හිජ්රි වර්ෂ (ලකුණු 04)

(3) ඔබ පාසලේ ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍ර පහක් ලියන්න. (ලකුණු 05)

(03)(1) මහා හිම යුගයේ දී දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) මිනිසා වෙනත් සතුන්ට වඩා ඉදිරියෙන් සිටීමට බලපා ඇති හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(3) ආදි මිනිසා ගින්දර සොයා ගැනීම නිසා ලබාගත් ප්‍රයෝජන දෙකක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

(04)(1) චීන ශිෂ්ටාචාරයේ වැසියන් ලෝකයට හඳුන්වා දුන් දායාද දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ ජන සමාජය බෙදී තිබූ කොටස් හතර නම් කරන්න. (ලකුණු 04)

(3) පහත දක්වෙන ශිෂ්ටාචාරවල නිර්මාණ රාශියක් වරහන් තුළ දක්වා ඇත. එම නිර්මාණ ශිෂ්ටාචාරවලට අදාළ ලෙස ගලපා වගුව සම්පූර්ණ කරන්න.

(පූජක මූර්තිය / පිරමිඩ / හෙගාපිටි රජිත / පෙල්ලම් මැටි කරත්තය / සත්ව සංකේත සහිත මැටි මුද්‍රා)

| ශිෂ්ටාචාරය | නිර්මාණය | |
|---|---|---|
| ඉන්දු නිම්න | a .............................. | b .............................. |
| මෙසපොතේමියානු | c .............................. | |
| ඊජිප්තු | d .............................. | e .............................. |

(ලකුණු 05)

(05)(1) විජය කුමරු හා කුවේණියට ලැබුණු දරුවන් දෙදෙනාගේ නම් ලියන්න. (ලකුණු 02)

(2) විජය කුමරු සමඟ පැමිණි ඇමතිවරුන් දෙදෙනෙකු නම් කර ඔවුන් පිහිටවූ ගම්මාන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) (a) දෙවන පැතිස් රජුගේ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න.

(b) පණ්ඩුකාභය රජු අනුරාධ පුර නගරයක් ලෙස නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(06)(1) අතීතයේ දී විවිධ ජාතීන් අපේ රට හඳුන්වා ඇති නම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) පහත සඳහන් තොරතුරු හා සම්බන්ධ රජවරුන් වරහන් තුළින් තෝරා ඉදිරියෙන් ලියන්න.

(මහසෙන් රජු / වලගම්බා රජු / පණ්ඩුකාභය රජු / වසභ රජු)

A අනුරාධපුරයේ නගර සීමා ලකුණු කිරීම

B ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරවීම

C උමං ජල මාර්ග ක්‍රමය හඳුන්වා දීම

D මින්නේරි දෙවියන් ලෙස හැඳින්වීම (ලකුණු 04)

(3) දුටුගැමුණු රජුගෙන් සිදු වූ සේවාවන් පහක් ලියන්න. (ලකුණු 05)

(07)(1) වසභ රජුගෙන් ආරම්භ වන රජ පෙළපත කුමක් ද? (ලකුණු 02)

(2) වසභ රජු කෘෂිකාර්මික දියුණුව සඳහා කරවන ලද වැව් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) (a) පාලන පහසුව සඳහා වසභ රජු යාපන ප්‍රදේශයට පත්කළ ඇමතිවරයා නම් කරන්න.

(b) වසභ රජ තුමා බුදු දහමේ දියුණුවට කරන ලද සේවාවන් දෙකක් ලියන්න. (ලකුණු 03)